# මහානාම හිමියන්ගෙන් සිංහල අවුරුද්දට පාඩමක්

පස්වැනි හයවැනි සියවස් මෙරට ඉතිහාසයේ තීරණාත්මක ම අවධිය බවට සැකයක් තිබිය නො හැකි ය. මහාවංශ කර්තෘ මහානාම හිමියන්ට ස්වල්ප කාලයකට පෙර මහාවිහාරික භික්ෂූන් වහන්සේ ථෙරවාදී ධර්මය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගත්හ. සිංහලෙන් තිබූ ධර්ම ග්‍රන්ථ මාගධී ප්‍රාකෘතයට හෙවත් පසුව පාළි යන නමින් හඳුන්වනු ලැබූ බසට පෙරළනු ලැබුයේ එයින් එක් පියවරක් ලෙස ය. බුද්ධඝෝෂ හිමියන්ගෙන් පසුව අටුවාව ධර්මයෙහි උරගල මෙන් විය. නව අර්ථකථන ධර්මයට එකතුවීම වැළැක්විණි.

එසේ වුවත් ප්‍රජාවන්හි හා එදිනෙදා කටයුතුවල දී මහායානික හා වෙනත් අදහස් සිංහල බෞද්ධයන් අතර ජනප්‍රිය වීම වැළැක්විය නො හැකි විය. ඇතැම් විට මහාවිහාරික භික්ෂූන් වහන්සේ එයට විරුද්ධ නොවන්නට ද ඇත. මෙරට තිබූ සංස්කෘතිය අනුව ඒ ඒ පෙදෙස්වල රාජ්‍යත්වයෙහි හැරෙන්නට වෙනත් කරුණුවල දී ජනතාවට නිදහසක් තිබිණි. පරිපාලනයෙහි තීරණ ගැනීමේ දී අනුරාධපුරයෙන් විමසා බැලීමේ පුරුද්දක් මෙරට නො වී ය. සිරිත් විරිත් අනුගමනය කිරීම ඒ ඒ ප්‍රදේශවල කටයුත්තක් විය.

මේ සිංහල අවුරුදු සමයෙහි අපි මුළු රටේ ම අද එක නැකතට ලිපි ගිනි දල්වමු. කිරිබත් කමු. එහෙත් දැනට අවුරුදු විසිපහකට පමණ පෙර තත්වය එසේ නො වී ය. අවුරුදු නැකත් කිහිපයක් ම විය. නෙනගතය උදාවීම ආදිය එකම වෙලාවට සිදු වුව ද ලිපි ගිනි දැල්වීම, කිරිබත් අනුභවය ආදිය එකම නැකතට සිදු නො විණි. එකම ගමේ විවිධ පවුල් විවිධ නැකැත් අනුව කටයුතු කළහ. මේ තත්වය දැනට අවුරුදු විසිපහකට පමණ පෙර නැති විය. ආණ්ඩුව මැදිහත් වී මුළු රටට ම බලපාන එකම නැකැත් මාලාවක් සම්පාදනය කෙරිණි. ඒ සමග ඉතිහාසයේ ප්‍රථම වරට අවුරුදු නැකැත් සම්පාදනය මධ්‍යගත කෙරිණි.

එහි යහපත් පැත්තක් මෙන් ම අයහපත් පැත්තක් ද වෙයි. මුළු රට ම එකම නැකතට කිරිබත් අනුභවය වැඩදායක විය හැකි ය. එහෙත් ඒ සමග ඒ ඒ ප්‍රදේශවලට තිබූ යම් ස්වාධීනත්වයක් නැති විය. එදා පන්සලේ ඝන්ඨාර නාදයට ඒ ඒ නැකතට අනුව ලිප ගිනි මෙළ වූ ගෘහිණියෝ අද රූපවාහිනියේ වෙලාව අනුව එකම නැකතට ලිප ගිනි මොළවති. මේ බ්‍රිතානි ඒකීය ක්‍රමයට කරන කටයුත්තක් මිස එකසේසත් ක්‍රමයට කෙරෙන කාර්යයක් නො වේ.

අනෙක් අතට එකම නැකතින් වැඩ කිරීම නිසා යාපනයේ ජනතාවට ද අද සිංහල අවුරුදු සිරිත් අනුගමනය කිරීමට හැකියාව ලැබී ඇත. එය මුස්ලිම් ජනයා අතරට ද පැතිරවීමේ හැකියාව සොයා බැලිය යුතු ය. ඉස්ලාම් හා ක්‍රිස්තු භක්තිකයෝ නැකැත් අනුගමනය නො කරති. එහෙත් ඔවුනට ද එකට වැඩ කිරීමට හැකි බව පෙන්වා දිය යුතු ය. කාර්යාල කටයුතු එකම වෙලාවට ආරම්භ කරන්නාක් මෙන් එසේත් නැත්නම් විභාග කටයුතු එකම වෙලාවට පටන් ගැනෙන්නාක් මෙන් අවුරුද්දට ලිපි ගිනි මෙළවීම, ආහාර අනුභවය ආදිය එකම වෙලාවට කිරීමට සියල්ලන් උනන්දු කළ හැකි ය.

අද අපට තීරණය කිරීමට සිදු වී ඇත්තේ අනාගත ලංකාව කෙබඳු ආකාරයක් ගන්නේ ද යන්න ය. එහි දී ඇතැම් කරුණුවල දී වඩාත් වැදගත් වන්නේ ප්‍රාදේශීය වශයෙන් යම් ස්වාධිනත්වයකට වඩා රට වශයෙන් පොදු එකඟත්වයකට පැමිණීම ය. සිංහල අවුරුද්ද මුළු ලංකාවේ ම ජාතික අවුරුද්ද බවට පත්කර ගැනීම රට වශයෙන් ගත්කල ජාතික අනන්‍යතාවක් ඇතිකර ගැනීමට උපකාරී වනු ඇත. ජනවාරි පළමුවැනි දා බටහිර ක්‍රිස්තියානීන්ගේ අවුරුද්ද උදාවන දවස මිස සිංහල ක්‍රිස්තියානීන් ද ඇතුළුව මෙරට කිසිම ජනකායකගේ අවුරුද්දක් නො වේ. හැරත් එදින විශේෂිත දවසක් ද නො වේ. ඒ හුදෙක් අභිමතයෙන් නියම කරගන්නා ලද්දකි.

එහෙත් සිංහල අවුරුද්ද සූර්යයාගේ චලිතය සමග සම්බන්ධ වෙයි. මේ පිළිබඳ විස්තර සිංහල අවුරුද්ද නම් කෘතියෙහි සඳහන් වෙයි. අද අප කළ යුත්තේ සිංහල අවුරුද්ද සිංහලයන්ට නැති නොකරගනිමින් එය රටේ ම ජාතික අවුරුද්ද බවට පත්කර ගැනීම ය. එය තරමක් අපහසු කටයුත්තක් වනු ඇත. සිංහල හා දෙමළ අවුරුද්ද, සිංහල හා හින්දු අවුරුද්ද වැනි ව්‍යාජ නම් පට නොබැඳ අවශ්‍ය නම් සිංහල අවුරුද්ද ජාතික අවුරුද්ද ලෙස හැඳින්විය හැකි ය.

ප්‍රාදේශීය අනන්‍යතා හැකිතාක් පවත්වාගෙන යන අතර ජාතික අනන්‍යතාවක් ද ඇතිකර ගැනීම අපේ ජාතික ප්‍රතිපත්තිය විය යුතු ය. එහි දී ප්‍රාදේශීය අනන්‍යතා ජාතික අනන්‍යතාවට ප්‍රතිවිරුද්ධ නොවන ආකාරයකට

© Prof. Nalin De Silva

පවත්වාගෙන යෑමට අප වග බලාගත යුතු ය. ඉතා පැහැදිලිව ම අද අපට ජාතික අනන්‍යතාවක් ගොඩනගා ගැනීමට සිදු වී ඇත. එය සංස්කෘතියෙහි ද වෙනත් අංශවල ද සිදු විය යුතු ය. අප ඉතිහාසය හැදෑරීමේ එක් අරමුණක් වනුයේ ජාතික අනන්‍යතාව ඇතිකර ගැනීම එකල කෙසේ සිදු විණිදැයි දැනගැනීම ය.

එහෙත් එදා සිදු වූ සියල්ල ඒ ආකාරයෙන් ම අද ද සිදුවනු ඇතැයි අපේක්ෂා නොකළ යුතු ය. එදා කළ යුතුව තිබුණේ යක්ෂ ගෝත්‍රිකයන් සිංහල ජාතිය සමග බද්ධකිරීම ය. පඬුඅබා රජු දවස ඇරඹුණු මේ කාර්යය පස්වැනි සියවස වන තෙක් ද නිම කර ගැනීමට නොහැකි ව තිබිණි. එය එක් අතකින් ගත්කල සිංහල ජාතියට තර්ජනයක් විය. සිංහල බෞද්ධ සංස්කෘතිය විසින් මේ වන විට යක්ෂ සංස්කෘතියෙහි බොහෝ අංග එකතු කරගනු ලැබ තිබිණි. අපි කලින් ලිපියක බෙර ගැන සඳහන් කෙළෙමු. යක්ෂ ගෝත්‍රිකයන්ගේ බෙර සිංහල බෞද්ධ සංස්කෘතියට අවශෝෂණය කෙරී තිබිණි. බෙර පංසලට ඇතුල් විණි යැයි සඳහන් වූයේ ඒ අරුතිනි. එහෙත් වචනාර්ථයෙන් ගත්කල පංසලට ඇතුල් කරගෙන තිබුණේ දවුල ය. අනෙක් බෙර සිංහල බෞද්ධ සංස්කෘතියට ඇතුල් වූ නමුත් පංසලට සෘජුව ම ඇතුල් කරගනු ලැබුයේ දවුල ය.

පස්වැනි සියවස වන විට සිංහල බෞද්ධ සංස්කෘතියට හා සිංහල ජාතියට තර්ජන තුනක් තිබී ඇති බව පැහැදිලි ය. එක් තර්ජනයක් යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ය. එක්කෝ සිංහල බෞද්ධ සංස්කෘතියට යක්ෂ ගෝත්‍රිකයන් ද ඇතුල් කරගත යුතුව තිබිණි. එසේත් නොමැති නම් යක්ෂ සංස්කෘතිය විසින් සිංහල සංස්කෘතිය ගිල ගනු ලැබිය යුතුව තිබිණි. ඒ අතර ජාත්‍යන්තර තර්ජන දෙකක් ද විය. ඒ ථෙරවාද බෞද්ධ සංස්කෘතිය මහායාන සංස්කෘතිය විසින් විස්ථාපනය කරනු ලැබීම හා දක්ෂිණ භාරතයෙන් එල්ල වූ ද්‍රවිඩ ආක්‍රමණ ය. මහානාම හිමියන් වැනි බුද්ධිමත් භික්ෂූන් වහන්සේලා ද ප්‍රබුද්ධ ගිහියන් ද මේ තත්වය ගැන අවධියෙන් සිටින්නට ඇත. මහානාම හිමියන් ගැමුණු කුමරුට අත් පා දිග හැරීමට නොහැකි වීම ගැන මහාවංසයෙහි සටහන් කරන අතර උන්වහන්සේගේ කාලයෙහි ඇති වූ තර්ජන ගැන ද සිතන්නට ඇත.

මහානාම හිමියන් ගැමුණු කුමරු දකින්නට ඇත්තේ උන්වහන්සේ ජීවත් වූ යුගයට සාපේක්ෂව ය. එහි වරදක් නැත. වාස්තවික ගැමුණු කුමරුවකු කිසිම ඉතිහාසඥයකුට කිසිම දිනෙක හමු නොවනු ඇත. අප දන්නා ගැමුණු කුමරු ප්‍රධාන වශයෙන් ම මහානාම හිමියන්ගේ නිර්මාණයක් යැයි කිව හැකි ය. එකල සමාජයේ තිබූ යම් යම් කරුණු එකතුකර මහානාම හිමියන් ගැමුණු කුමරු නිර්මාණය කර ඇතැයි කීමේ වරදක් නැත. මහානාම හිමියන්ගේ ගැමුණු කුමරු මෙන් ම උන්වහන්සේ ලියූ ඉතිහාස කතාව ද උන්වහන්සේ ජීවත් වූ යුගයට සාපේක්ෂ ය. අද අප දක්නා මහානාම හිමියන් අප ජීවත්වන යුගයට සාපේක්ෂ ය. මෙහි දැක්වෙන මහානාම හිමියන් මුණගැසෙන්නේ අපට ය. ඉතිහාසයෙහි මෙතෙක් කල් මෙවැනි මහානාම හිමිනමක හමු වී නැත. ඒ පිළිබඳ අපට දොස් පැවරීමෙන් ඵලක් නැත. අපට දැනුම පිළිබඳ මේ සාපේක්ෂතාවෙන් පෘථග්ජනයන් ලෙස ගැලවීමක් නැත. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි මේ කරුණ විස්තර කෙරෙයි. නිර්මාණාත්මක සාපේක්ෂතාවෙන් ගැලවීමට නම් නිවන් අවබෝධ කළ යුතු ය.

මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේ ථෙරවාදය ආරක්ෂා කිරීමට කෙතරම් පියවර ගත්ත ද වෙනත් අදහස් පස්වැනි හයවැනි සියවස්වල  මෙරට තිබී ඇත. එමෙන් ම වෙනත් ගුරුකුලවල භික්ෂූන් වහන්සේ යම් ප්‍රමාණයකට බලවත් ව සිටි බව ද පැහැදිලි වෙයි. ධාතුසේන රජතුමා අම්බස්ථලයෙහි විහාරයක් කරවා එය මහාවිහාරික භික්ෂූන් වහන්සේට පූජාකිරීමට සූදානම් වූ අවස්ථාවෙහි ධර්මරුචික භික්ෂූන් වහන්සේ තමන්ට ඒ විහාරය පූජාකරන ලෙස ඉල්ලූ බවත් රජතුමා අවසානයේ දී එසේ කළ බවත් සඳහන් වෙයි. මහාවිහාරයට පක්ෂ වූ ධාතුසේන රජතුමාට තමන්ට රිසි පරිදි කටයුතු කිරීමට නොහැකි වූ බව මෙයින් හෙළිවෙයි. යක්ෂ ගෝත්‍රිකයන් මහසෙන් රජු කාලයේ සිට පැවත ආ ධර්මරුචික භික්ෂූන් වහන්සේට පක්ෂපාති වී යැයි සිතාගැනීම අපහසු නො වේ.

කෙසේ වෙතත් මහානාම හිමියන් හා වෙනත් භික්ෂූන් වහන්සේට මුහුණ පෑමට සිදුවූ කරුණු අතර වර්ධනය වූ යක්ෂ ගෝත්‍රිකයන්ගේ බලය බිඳීම, පැතුරුණු මහායාන අදහස්වලින් ථෙරවාදය ආරක්ෂා කිරීම ප්‍රධාන වන්නට ඇතැයි සිතිය හැකි ය. මහානාම හිමියන් ධාතුසේන කුමරු කුඩා කළ සිට ම රජකමට පුරුදු කළ බව පැවසෙයි. උන්වහන්සේ එකුමරු මේ කරුණු සම්බන්ධයෙන් දැනුවත් කරන්නට ඇත. මහානාම හිමියන් හා අනෙක් ප්‍රධාන ප්‍රබුද්ධ භික්ෂූන් වහන්සේ මහායාන අදහස් පැතිර යෑමට විරුද්ධව යමක් කරනවා වෙනුවට ඒ සඳහා යම් අනුග්‍රහයක් ලබා දී ඇති බව පෙනී යයි. අවුකන බුදු පිළිම වහන්සේ නිර්මාණය කිරීම ඒ අනුග්‍රාහක ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

එසේ අනුග්‍රාහක ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් ථෙරවාද ධර්මයට කිසිදු ප්‍රශ්නයක් ඇති නොවන බව මහානාම හිමියන් ඇතුලු මහාවිහාරික භික්ෂූන් වහන්සේට පෙනී යන්නට ඇත. එයට හේතුව ධර්මය ඒ වෙනවිට පාලි භාෂාවෙන් ලියා තිබීම ය. අනෙක් පැත්තෙන් සමස්තයක් ලෙස ගත්කල ථෙරවාදයට විරුද්ධ වූ යක්ෂ ගෝත්‍රිකයන්ට මේ අනුග්‍රාහක ප්‍රතිපත්තිය ප්‍රශ්නයක් වන්නට ඇත. ඔවුන්ට ඒ ප්‍රතිපත්තියට පක්ෂවීම හෝ විපක්ෂවීම හෝ ගැටලුවන් වන්නට ඇත. ඒ අතර මහාවිහාරික නොවන භික්ෂූන් වහන්සේ ද ඒ ප්‍රතිපත්තිය හේතුකොටගෙන අවුලකට පත්වන්නට ඇතැයි සිතිය හැකි ය.

ධාතුසේන රජතුමා අම්බස්ථල විහාරය අවසානයේ දී ධර්මරුචික භික්ෂූන් වහන්සේට පූජා කෙළේ ද එක් පැත්තකින් බලවත් වූ උන්වහන්සේ අමනාප කර නොගැනීමටත් අනෙක් පැත්තෙන් විහාරය මහාවිහාරික භික්ෂූන් වහන්සේට ප්‍රජා කිරීම ධර්මරුචික භික්ෂූන් වහන්සේට විරුද්ධත්වය පෑම සඳහා හේතුවක් කර ගැනීමට ඉඩ නොතැබීමටත් යැයි පෙනී යයි. එසේ යක්ෂ ගෝත්‍රිකයන් හා මහාවිහාරික නොවන භික්ෂූන් වහන්සේ සංස්කෘතික (ආගමික) කටයුතු සම්බන්ධයෙන් විරුද්ධ කර නොගන්නා අතර කලාවැව නිර්මාණය වැනි ආර්ථික කටයුතුවලට සම්බන්ධ කරුණුවල දී යක්ෂ ගෝත්‍රිකයන්ට විරුද්ධවන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. මේ සම්බන්ධයෙන් තව දුරටත් සාකච්ඡා කළ යුතු වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva